# ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය
# කොළඹ
# ප්‍රවෘත්ති නිවේදනය


මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070

විද්‍යුත් තැපෑල: VanHornNT@state.gov http://lk.usembassy.gov


නිවේදන අංක: 11012018

**එක්සත් ජනපද තානාපතිනි ටෙප්ලිට්ස් ජනාධිපති සිරිසේන වෙත අක්තපත්‍ර පිළිගන්වයි.**

කොළඹ, නොවැම්බර් 1: තානාපතිනි ඇලයිනා බී. ටෙප්ලිට්ස්, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනට අද තම අක්තපත්‍ර පිළිගැන්වීමෙන් පසු ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති ලෙස ඇගේ ධුර කාලය ආරම්භ කළාය. ජනාධිපතිතුමාගේ නිල නිවාසයේ පැවති මෙම උත්සවයට තානාපතිනි ටෙප්ලිට්ස් සමග ඇගේ සැමියා වූ රොබට් සෝල්ද සහභාගි විය.

මෙම රටට සහ කලාපයට වැදගත් මොහොතක ඇමෙරිකානු තානාපතිනිය ලෙස කටයුතු කිරීමට ලැබීම මා ලද ගෞරවයක් ලෙස සලකන්නෙමි. ශ්‍රී ලංකාව සාමය සහ සමෘද්ධියට යන මාවතට එක්සත් ජනපදය දශක හතක් පුරා සහාය ලබා දී ඇත. ආරක්ෂාකාරී සහ සෞභාග්‍යයමත් ඉන්දු-පැසිෆික් කලාපයක් ගොඩ නැගීම සඳහා ඔබ සමග එක්ව අභියෝග ජය ගෙන ලැබෙන අවස්ථා නිසිසේ ප්‍රයෝජනයට ගැනීමට මා කැමැත්තෙන් සිටින්නෙමි. "අපට එක්ව මානව හිමිකම් වලට ගරු කරන ප්‍රජාතන්ත්‍රවාදයක, සියලු ජනයාට අනුබල ලබා දෙන අනාගතයක් ගොඩ නගා ගැනීමට හැකි වන්නේය." යැයි තානාපතිනී ටෙප්ලිට්ස් පැවසූවාය.

තානාපතිනි ටෙප්ලිට්ස් 2015-2018 දක්වා නේපාලයේ එක්සත් ජනපද තානාපති ලෙස සේවය කර තිබේ. උපදේශක මට්ටමේ ජ්‍යෙෂ්ඨ විදේශ දූත සේවා නිලධාරිනියක් වන ඇය රාජ්‍ය දෙපාර්තමේන්තුවට බැඳුණේ 1991 දීය. 2012 සිට 2015 දක්වා කාලය තුළ ඇය ප්‍රතිපත්ති, නිවැරදි ප්‍රමාණනය හා නව්‍යකරණය පිළිබඳ කළමනාකරණ කාර්යාලයේ (M/PRI) අධ්‍යක්ෂ ලෙස කටයුතු කර තිබේ. මෙහිදි එක්සත් ජනපද විදේශ දූත සේවා ක්‍රියාත්මක වන ආකාරය වැඩිදියුණු කිරීමේ නව ක්‍රම හඳුන්වා දෙමින් දැනුම් කළමනාකරණය, දත්ත භාවිතය හා අවදානම් කළමනාකරණය ආදිය දියුණු කිරිමටද ඇය කටයුතු කළාය. එයට පෙර 2011-2012 කාලය තුළ තානාපතිනි ටෙප්ලිට්ස් කාබුල් හි එක්සත් ජනපද තානාපති කාර්යාලයේ කළමනාකරණ උපදේශක ලෙස කටයුතු කර ඇත. ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද රජයේ දූත මණ්ඩල ප්‍රධානීගේ සිවිල් කටයුතු අධීක්ෂණ කණ්ඩායමට නායකත්වය සැපයූ ඇය, හමුදා බලඇණි අඩුකිරීමේ කටයුතුද සැලසුම් කළාය.

*ඡායාරූපයේ කැප්ෂනය: ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ එක්සත් ජනපද තානාපතිනි ඇලයිනා බී. ටෙප්ලිට්ස්, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනට අක්තපත්‍ර පිළිගැන්වූ අවස්ථාව*